# රුහුණ විශ්වවිද්‍යාලය

## 2016/2017 ශාස්ත්‍රවේදී (සාමාන්‍ය/ විශේෂ) උපාධි - 2000 ස්ථලය
## දෙවන සමාසික පරීක්ෂණය - 2018 මැයි

## BPH 22513/ 22613 – බෞද්ධ ආචාර විද්‍යාව

**ප්‍රශ්න හතරකට (04) පමණක් පිළිතුරු සපයන්න.**

**කාලය : පැය 03 යි.**

---

01. "සදාචාර ධර්ම වූ කලි මිනිස් චර්යාවන් ඇගයීම සඳහා ඒ ඒ ආගමික හා දාර්ශනික ඉගැන්වීම් වලට පාදක වන්නා වූ මූලධර්මයන් මත ගොඩනැගුණකි." සාකච්ඡා කරන්න.

02. වෛදික යුගයේ සිට උපනිෂද් යුගය දක්වා කාලය තුළ සදාචාර ධර්මයන්ගේ විකාශයක් සිදු වූ අයුරු දක්නට ලැබෙන්නේ දැයි අදාළ මූලාශ්‍රය ඇසුරින් පෙන්වා දෙන්න.

03. බෞද්ධ සදාචාර ධර්මයන්හි දක්නට ලැබෙන යුක්ත්‍යාත්මක (Deontological) හා සාධ්‍යාත්මක (Teleological) ලක්ෂණ නිදසුන් සහිතව විස්තර කරන්න.

04. "අපරාධ මර්ධනය හුදෙක් දඬුවමින් පමණක් පාලනය කළ නොහැකි ය." බෞද්ධ සූත්‍රානුසාරයෙන් සාකච්ඡා කරන්න.

05. බෞද්ධ ආචාර විද්‍යාවේ ස්වභාවය නිදසුන් දක්වමින් පැහැදිලි කොට එහි කාර්යභාරය පිළිබඳ විමසීමක් කරන්න.

06. සදාචාර සම්පන්න සමාජයක් ගොඩනැංවීමෙහි ලා බෞද්ධ පුනර්භව සංකල්පයේ උපයෝගීතාව ප්‍රකට කරන්න.

07. ස්වච්ඡන්දතාව හඳුන්වා මූලික බෞද්ධ ඉගැන්වීම්වල ස්වච්ඡන්දතාවක් පවතීද යන්න විමසන්න.

08. පහත දැක්වෙන මාතෘකා තුනක් (03) පිළිබඳ ප්‍රමාණවත් විස්තර සපයන්න.

    i. කුසලාකුසල මිණුම් දඬු
    ii. කර්මය හා ආචාර ධර්ම
    iii. සප්ත විශුද්ධිය
    iv. පංචශීල ප්‍රතිපදාව
    v. පාරමිතා ධර්ම
    vi. ත්‍රිශික්ෂා

(එක් ප්‍රශ්නයකට ලකුණු 15 බැගිනි)

@@@@@@@@@@@@@@@@@